# නික්ම යාම. . .

නික්ම යාම. . .



කේ.පී. ශ්‍රියාපාල මැතිතුමා වසර 33 කාලයක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සේවය කිරීමෙන් පසුව 2013 අගෝස්තු මස 10 දින විශ්‍රාම ගනු ලැබීය.

එතුමා 1953 අගෝස්තු මස 10 දින මාතර දෙයියන්දර කැටියපේ ග්‍රාමයේදී උපත ලබා කැටියපේ මහා විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලබා දෙයියන්දර මහා විද්‍යාලයෙන් හා අකුරැස්සේ ගොඩපිටිය මහා විද්‍යාලයන්හිදී ද්විතීය අධ්‍යාපනය ලබා ඇත. උසස් පෙළ විශිෂ්ට ලෙස සමත්වීමෙන් අනතුරුව 1975 පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පීඨයට ඇතුලත්ව දෙවන පෙළ සාමාර්ථයක් ලබා 1980 සැප්තැම්බර් මස 10 දින විෂයානුගත විශේෂඥ නිළධාරියෙකු ලෙස කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සේවයට එක්විය. එතුමා පිලිපීනයේ ලොස් බානෝස් විශ්ව විද්‍යාලයෙන් පශ්චාත් උපාධිය ලබාගෙන ඇත.

මුලින්ම මහවැලි කලාවැව කොට්ඨාශයේ කෘෂිකර්ම නිළධාරියෙකු ලෙසද ඉන් පසු මහඉලුප්පල්ලම සේවා සංස්කරණ ආයතනය, ව්‍යාප්ති හා පුහුණු අංශය, ගන්නෝරුව සේවා සංස්කරණ පුහුණු ආයතනය, කුණ්ඩසාලේ කෘෂිකර්ම විද්‍යාලය, ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය යන විවිධ ආයතන වල සේවය කොට කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් ලෙස වසරකුත් මාස හතරක කාලයක් සේවය කොට ඇත.

කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් ලෙස කෙටි කාලයක් සේවය කලද එම වකවානුව තුල වසර ගණනාවක් කෘෂිකර්ම දෙපාර්තමේනතුවේ නිම කිරීමට නොහැකිව තිබූ ගැටළු රාශියක් විසඳීමට එතුමාට හැකි විය. තනතුරු රාශියකට නව ප්‍රවේශයකින් බඳවාගත් අතර කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විවිධ ආයතන වල යටිතල පහසුකම් සංවර්ධනය පිණිස යොදාගනු ලැබූ පියවරන් සදා අප හදවත් තුල නොමැකෙන සේ ලියවී ඇත.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙනුවෙන් එතුමා සිදුකරන ලද සේවාව සමස්ථ ගොවි ජනතාව උදෙසා සිදුකරන ලද සේවාවක් ලෙස හඳුන්වාදිය හැකි අතර එතුමාගේ විශ්‍රාම දිවිය ඉතා වාසනාවන්ත වේවායි ගොවිකම් සඟරාවේ ශුභාසිංශන පිරිනමමු. . .

